කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - දකුණු පළාත
முகாமைத்துவ அபிவிருத்தி பயிற்சி நிலையம் - தென் மாகாணம்
Management Development & Training Institute - Southern Province
වක්වැල්ල, ගාල්ල. வக்வெள்ள,காலி. Wakwella, Galle.
MDTI SP
Success through the Management and Development

මගේ අංකය / எனது இல. / My No. MDTI-SP/TU/01/2025/DUT/11 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025.08.12

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>විනයකාර්ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව</u>**

දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මගින් සංවිධානය කරනු ලබන මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ දකුණු පළාත තුළ රාජ්‍ය සේවයේ විනය පවත්වාගැනීම සඳහා මූලික විමර්ශන පැවැත්වීම, පැමිණිල්ල මෙහෙයවීම සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අදාළව නිලධාරී සංචිතයක් නිර්මාණය කිරීම වේ.

02. ඒ අනුව, පැය 120කින් (දින 20) සමන්විත මෙම සහතිකපත්‍ර පාඨමාලාව සඳහා **<u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු ද්විතියික සේවා මට්ටමේ නිලධාරීන්ගේ සිට ඊට ඉහළ නිලධාරීන් සඳහා</u>** සහභාගී වීමේ අවස්ථාව පවතින අතර, නිලධාරීන් **<u>75ක කණ්ඩායමක් පමණක්</u>** සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

03. තවද, දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් හට පමණක් මෙම පාඨමාලාව නොමිලේ හැදෑරීම සඳහා අවස්ථාව පවතින අතර, මධ්‍යම රජයේ නිලධාරීන් වෙතින් පාඨමාලා ගාස්තුව ලෙස රු.30,000.00ක මුදලක් අය කර ගැනීමට සිදුවන බව කාරුණික ව දන්වා සිටිමි.

04. ඒ අනුව, මේ සඳහා අයදුම් කරන නිලධාරින් ලබා දී ඇති ආදර්ශ අයදුම්පත්‍රය පරිදි සකසා ගනු ලබන අයදුම්පත්‍රය **<u>2025.08.31 දිනට පෙර</u>** "අධ්‍යක්ෂ, දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය, වක්වැල්ල, ගාල්ල" යන ලිපිනයට ලැබෙන සේ යොමු කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි. 2025.08.31 දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත්‍රයක් භාර නොගන්නා බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. මෙම පුහුණුව සඳහා අයදුම් කරනු ලබන නිලධාරීන් අතුරින් පුහුණුව සඳහා තෝරා ගනු ලබන නිලධාරීන්ගේ නාම ලේඛනය [www.mdtisp.lk](http://www.mdtisp.lk) වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, මේ සඳහා **<u>වයස අවුරුදු 55ට අඩු සහ දකුණු පළාත තුළ රාජ්‍ය සේවයේ විනය පවත්වාගැනීම සඳහා මූලික විමර්ශන පැවැත්වීම, පැමිණිල්ල මෙහෙයවීම සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමේ සංචිතයට ඇතුළත්ව කටයුතු කිරීමට එකඟතාවය පළ කරනු ලබන නිලධාරීන් පමණක්</u>** බඳවා ගනු ලැබේ.

06. මෙම පුහුණුව සඳහා සහභාගී වන නිලධාරීන් මෙම පාඨමාලාව සම්බන්ධයෙන් දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ සමඟ ගිවිසුමකට යටත් වේ. ඒ අනුව, <u>යම් නිලධාරියෙකු අවසාන විභාගය සමත් නොවන්නේ නම් හෝ පුහුණු පාඨමාලාව අවසන් වන තෙක් සම්බන්ධ නොවන්නේ නම් හෝ ගිවිසුම්ගත මුදල දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය වෙත ගෙවීමට බැඳී සිටින බව</u> මින් අවධාරණය කරනු ලැබේ.

07. තවද, මෙම පාඨමාලාව සඳහා සහභාගීවන අයට නොමිලේ ආහාරපාන සපයනු ලබන අතර, සහභාගිත්වය තහවුරු කිරීමෙන් පසුව පූර්ව අනුමැතියකින් තොරව පාඨමාලාව සඳහා සහභාගී නොවුනහොත් ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක 01/2014 අනුව එම මුදල අදාල නිලධාරියාගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

08. ඒ අනුව, ඔබ ආයතනය හා ඒ යටතේ පවතින සියලුම ආයතනවල අදාළ නිලධාරීන් මේ පිළිබඳ නොපමාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**ඒ.පී.ජී. රොෂාන් අමරසිංහ,**
**අධ්‍යක්ෂ,**
**කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය,**
**දකුණු පළාත.**